# කෘෂිකර්මය

## සමස්ත උපනතීන්

1993 වර්ෂයේ දී ශක්තිමත් ලෙස යථාතත්වයට පත්වූ කෘෂිකාර්මික අංශය යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් තවදුරටත් වර්ධනය වී 1994 වර්ෂය තුළදී තේ, වී සහ සීනි නිෂ්පාදනයන් මෙතෙක් වාර්තා වී ඇති ඉහළම නිෂ්පාදන මට්ටම පෙන්විය. තේ නිෂ්පාදනය සියයට 4 කින් වර්ධනය වී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 242 ක් වූ වැඩිම නිෂ්පාදනය වාර්තා කරන ලදී. මේ අතර, 1994 වර්ෂයේ රබර් නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා සුළු වැඩිවීමක් පෙන්නුම් කරමින් කිලෝග්‍රෑම් දශලක්ෂ 105 ක් විය. 1994 වර්ෂයේ වී නිෂ්පාදනය 1993 වර්ෂයට වඩා සියයට 4 කින් වර්ධනය විය. මෙය මෙතෙක් වාර්තා වී ඇති වැඩිම නිෂ්පාදනය වූ 1985 වර්ෂයේ නිෂ්පාදන මට්ටමටත් වඩා මෙට්‍රික් ටොන් 23,000 ක වැඩිවීමකි. සීනි නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා සියයට 5 කින් වර්ධනය විය. සුළු අපනයන බෝග හා අතුරු ආහාර බෝග බොහොමයක නිමවුම 1994 වර්ෂයේදී සැලකියුතු වර්ධනයක් වාර්තා කළේය.

වසර 5 කට ආසන්න කාලයකට පසු පොහොර සහනාධාර ක්‍රමය නැවත හඳුන්වාදීම, 1994 වසර තුළදී ගනු ලැබූ වැදගත් ප්‍රතිපත්තිමය තීරණයක් විය.

## ප්‍රධාන අපනයන බෝග


### තේ

1994 වර්ෂයේ තේ නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් කිලෝග්‍රෑම් දශලක්ෂ 242 ක් විය. මෙය මෙතෙක් වාර්තා වී ඇති ඉහළම නිෂ්පාදනය වේ. මෙම යහපත් ක්‍රියාකාරීත්වයට හේතු වී ඇත්තේ සලකා බලන වර්ෂය තුළදී පැවැති යහපත් කාලගුණික තත්ත්වය හා යහපත් කළමනාකරණයයි. 1993 වර්ෂයේ පහත් බිම් තේ නිෂ්පාදනය සියයට 28 කින් වැඩිවී කිලෝග්‍රෑම් දශලක්ෂ 112 ක් වූ අතර, 1994 වර්ෂයේ එය තවදුරටත් සියයට 5 කින් වර්ධනය වී කිලෝග්‍රෑම් දශලක්ෂ 118 ක් විය. උස්බිම් තේ නිෂ්පාදනය සියයට 6 කින් වැඩි වී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 77 ක් ලෙස වාර්තා වූ අතර, මැදි බිම් තේ නිෂ්පාදනය 1993 වර්ෂයේ මට්ටමෙහිම නොවෙනස්ව පැවතුණි. මේ අතර, සී.ටී.සී. (කපා, ඉරා, අඹරන ලද) තේ නිෂ්පාදනය සියයට 40 කින් වැඩි වී 1994 වර්ෂයේ කිලෝග්‍රෑම් දශලක්ෂ 11.2 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මුළු තේ නිෂ්පාදනයට සී.ටී.සී. තේ නිෂ්පාදනයේ දායකත්වය 1993 වර්ෂයේ සියයට 3 සිට 1994 වර්ෂයේ සියයට 4 දක්වා වැඩි විය.

1993 වර්ෂයේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 147,200 ක් වූ තේ වගා අංශය භාවිතා කළ පොහොර ප්‍රමාණය, 1994 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 131,000 ක් දක්වා අඩු විය.

1994 වර්ෂය තුළදී සියළුම අංශයන්හි තේ නැවත වගා කිරීම සඳහා දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය හෙක්ටයාරයකට රුපියල් 36,000 ක් ලෙස නොවෙනස්ව පැවතිණ. මේ අතර, පහත් බිම් අංශයේ තේ වගා කිරීම සඳහා දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය ද රුපියල් 57,000 ක් ලෙස නොවෙනස්ව පැවති අතර, උස්බිම් හා මැදිබිම් අංශයන්ට දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය හෙක්ටයාරයකට රුපියල් 67,000 ක් ලෙසම පැවැතුණි. 1994 වර්ෂයේ නැවත වගා කළ මුළු තේ බිම් ප්‍රමාණය සියයට 5 කින් පහත වැටී හෙක්ටයාර 1,239 ක් වූ අතර, අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 10 කින් පහත වැටී හෙක්ටයාර 1,450 ක් විය. වර්ෂය තුළදී නැවත වගාව සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය සියයට 13 කින් වර්ධනය වී රුපියල් දශලක්ෂ 33 ක් වූ අතර, අළුතින් වගා කිරීම සඳහා දෙන ලද සහනාධාර ප්‍රමාණය සියයට 16 කින් පහත වැටී රුපියල් දශලක්ෂ 42 ක් විය. මේ අතර, 1994 වර්ෂයේ දී තේ කම්හල් සංවර්ධන සහනාධාර ක්‍රමය යටතේ දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය සියයට 54 කින් තවදුරටත් පහත වැටී රුපියල් දශලක්ෂ 21 ක් විය.

# ප්‍රධාන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය




ශ්‍රී ලංකා මහ බැංකුව.

සී.ටී.සී තේ කම්හල් නවීකරණය කිරීම සඳහා 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය හඳුන්වා දුන් සහනාධාර ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරන ලද අතර, මේ යටතේ යන්ත්‍ර පිරිවැයෙන් සියයට 70 ක් සහනාධාර ලෙස සපයන ලදී . (මැදි බිම් ප්‍රදේශවල පිහිටුවා ඇති කර්මාන්ත සඳහා සියයට 85) මීට අමතරව, 1994 ඔක්තෝබර් මස 01 දින හෝ ඊට පෙර ආරම්භ කරන ලද කර්මාන්තශාලා වල සී. ටී. සී. යන්ත්‍ර අලුතින් සවිකිරීම හා නිෂ්පාදනය ආරම්භ කිරීම වෙනුවෙන් මුළු පිරිවැයෙන් සියයට 15 ක් දිරි දීමනාවක් ලෙස ගෙවන ලදී. එසේ වුවද, මෙම දිරි දීමනාව ගෙවනු ලැබුවේ ආරම්භයෙන් පසු අඛණ්ඩව මාස තුනක් නිෂ්පාදනයෙහි නියැළුණු කර්මාන්තශාලා වලට පමණි.

1.9 සංඛ්‍යා සටහන

**තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1992 - 1994**

| ශීර්ෂය | ඒකකය | 1992 | 1993(අ) | 1994(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශලක්ෂ | 178.9 | 231.9 | 242.2 |
| 1.1 උස් බිම් | කි.ග්‍රෑ. දශලක්ෂ | 53.7 | 72.6 | 76.7 |
| 1.2 මැදි බිම් | කි.ග්‍රෑ. දශලක්ෂ | 37.9 | 47.2 | 47.4 |
| 1.3 පහත් බිම් | කි.ග්‍රෑ. දශලක්ෂ | 87.3 | 112.1 | 118.1 |
| 2. තේ වගාව යටතේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | ලැ.නො(ඇ) | ලැ.නො.(ඇ) |
| 3. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 110.2 | 147.2 | 131.0 |
| 4. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 1,417 | 1,311 | 1,239 |
| 5. මිළ | | | | |
| 5.1 කොළඹ (ශුද්ධ) | කි.ග්‍රෑ./රුපියල් | 60.51 | 68.88 | 65.12 |
| 5.2 අපනයන (නැ.වි.ස) | කි.ග්‍රෑ./රුපියල් | 81.98 | 91.16 | 91.32 |
| 6. නිෂ්පාදන වියදම | කි.ග්‍රෑ./රුපියල් | 72.26 | 75.81 | 73.83 |
| 7. අපනයන | කි.ග්‍රෑ. දශලක්ෂ | 181.7 | 218.4 | 229.6 |
| 8. අපනයන ඉපැයුම් | කි.ග්‍රෑ. දශලක්ෂ (විගැහි දශලක්ෂ) | 14,893.4 (241) | 19,911.1 (296) | 20,963.7 (296) |
| 9. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඈ) | | 2.0 | 2.4 | 2.3 |

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය; ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.
(ඈ) 1993 ජනවාරි 01 දින සිට තේ කොමසාරිස් විසින් අළුත් තේ ඉඩම් ලියාපදිංචි කිරීම අත්හිටුවන ලදී.

සකස් කරන ලද තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1994 වර්ෂයේදී රුපියල් 73.83 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වර්ෂයේ නිෂ්පාදන පිරිවැයට වඩා සියයට 3 ක අඩු වීමකි.

කොළඹ තේ වෙන්දේසියේ සියළුම වර්ගවල තේ සඳහා වූ සාමාන්‍ය දළ මිළ 1993 වර්ෂයේ පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 68.88 සිට 1994 වර්ෂයේ කිලෝග්‍රෑමයකට රුපියල් 65.12 ක් දක්වා සියයට 5 කින් පහත වැටුණි. කෙසේ වෙතත් සාමාන්‍ය අපනයන මිළ (නැ. වි. ස.) සුළු වශයෙන් වර්ධනය වී කිලෝග්‍රෑමයකට රුපියල් 91.32 ක් විය. කොළඹ තේ වෙන්දේසියේ පැවති

අඩු මිළ ගණන් හා සිව්වන වතාවටත් සෑණ ලාභ ආන්තිකයක් පැවතීම තේ වැවිලිකරුවන් හා කර්මාන්තකරුවන් අසීරු තත්ත්වයකට පත්වීමට හේතු විය. මෙය වැඩි වශයෙන් බලපාන ලද්දේ පහත් බිම් ප්‍රදේශවල ප්‍රමුඛත්වය ගෙන සිටින පෞද්ගලික අංශයටය. මෙම අයහපත් මිළ උපනතීන් නිසා කොළඹ තේ වෙන්දේසියේ මිළ ගණන් පහත බැසීම පිළිබඳ කරුණු විමර්ශණය කිරීමට රජය විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරන ලදී.

1994 වර්ෂය තුළදී ද තේ සෙස් අය කිරීම රුපියල් 2 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. වර්ෂය තුළදී එකතු කරන ලද මුළු සෙස් අය කිරීම් පසුගිය වර්ෂයේ පැවති රුපියල් දශලක්ෂ 446 සිට සියයට 5 කින් වර්ධනය වී රුපියල් දශලක්ෂ 469 ක් විය.

## රබර්

1994 වර්ෂයේදී කිලෝග්‍රෑම් දශලක්ෂ 105 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති රබර් නිෂ්පාදනය පසුගිය වසරට වඩා සියයට 1 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

වර්ෂය තුළදී ෂීට් රබර් සහ ක්‍රේප් රබර් නිෂ්පාදනය වැඩි විය. මුළු නිෂ්පාදිතයෙන් සියයට 42 ක් ලෙස ගණනය කොට ඇති ෂීට් රබර් නිෂ්පාදනය සියයට 1කින් ඉහළ ගොස් කිලෝග්‍රෑම් දශලක්ෂ 44 ක් වූ අතර, ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 4 කින් ඉහළ ගොස් කිලෝග්‍රෑම් දශලක්ෂ 35 ක් විය. මීට එරෙහිව යමින් තාක්ෂණිකව විශේෂණය කරන ලද රබර් නිෂ්පාදනය සියයට 6 කින් පහත වැටී කිලෝග්‍රෑම් දශලක්ෂ 13 ක් විය.

1994 වර්ෂයේ දී රබර් වගා අංශය භාවිතා කරන ලද මුළු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 16,700 ක් විය. මෙය පසුගිය වසරෙහි භාවිතා කළ ප්‍රමාණයට වඩා සියයට 7 ක අඩුවීමකි.

1994 වර්ෂයේ රබර් වගාව යටතේ ලියාපදිංචි වී ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 794 කින් සුළු වශයෙන් අඩුවී හෙක්ටයාර 191,554 ක් වූ අතර, කිරි කැපීම යටතේ වූ බිම් ප්‍රමාණය සියයට 4 කින් වැඩි වී හෙක්ටයාර 151,600 ක් විය. වසර තුළදී කුඩා වතු හිමියන් විසින් හෙක්ටයාර 1,374 ක බිම් ප්‍රමාණයක් රබර් නැවත වගාකරන ලද අතර 1993 දී මෙම බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,084 ක් විය. 1994 වර්ෂයේ දී අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය ද සියයට 40 කින් පහත වැටී හෙක්ටයාර 538 ක් විය. වසර තුළදී නැවත වගා කරන ලද සහ අළුතින් වගාකරන ලද බිම් ප්‍රමාණය පහත වැටීම හේතුකොටගෙන නැවත වගා කිරීම සඳහා ලබාදුන් සහනාධාර ප්‍රමාණය, 1993 වසර සමඟ සසඳන කළ සියයට 38 කින් අඩුවී රුපියල් දශලක්ෂ 65 ක් වූ අතර, අළුතින් වගා කිරීම සඳහා ලබාදුන් සහනාධාර ප්‍රමාණය සියයට 32 කින් අඩුවී රුපියල් දශලක්ෂ 22 ක් විය.

1993 වර්ෂයේ කිලෝග්‍රෑම් 714 ක් වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව 1994 වර්ෂයේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 692 දක්වා පහත වැටුණි. පුහුණු කිරි කපන්නන්ගේ හිඟය හේතුකොටගෙන කිරි කැපීමේ දින ගණන අඩුවීම රබර් ඵලදාව පහත වැටීමට හේතුවිය.

සියළුම රබර් වර්ගයන්හි සාමාන්‍ය අපනයන (නැ. වි. ස.) මිළ 1993 දී කිලෝග්‍රෑමයකට රුපියල් 44.34 හි සිට 1994 දී කිලෝග්‍රෑමයකට රුපියල් 51.81 දක්වා සියයට 17 ක වර්ධනයක් වාර්තා කළේය. 1994 වර්ෂයේ කොළඹ රබර් වෙන්දේසියේ ආර්. එස්. එස්. 1 හි සාමාන්‍ය මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 50.48 දක්වා සියයට 42 කින් වැඩි වූ අතර ආර්. එස්. එස්. 2 හි සාමාන්‍ය මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 49.57 දක්වා සියයට 47 කින් වැඩි විය. සැප්තැම්බර් මාසයෙහි අග භාගයෙහි පටන් කොළඹ වෙන්දේසියේ සාමාන්‍ය මාසික රබර් මිළ ගණන් ඉහළ යමින් පැවැති අතර, 1994 දෙසැම්බර් මාසයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 66.17 ක් වූ වාර්තාගත ඉහළ මිළක් ලැබිණ.

## 1.10 සංඛ්‍යා සටහන
## රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1992 - 1994

| ශීර්ෂය | ඒකකය | 1992 | 1993 (අ) | 1994(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශලක්‍ෂ | 106.1 | 104.2 | 105.0 |
| 2. බිම් ප්‍රමාණය | | | | |
| 2.1 වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 194.6 | 192.3 | 191.6 |
| 2.2 කිරි කැපීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | 146.3 | 145.9 | 151.6 |
| 3. ඵලදාව | හෙක්ටයාරයකට කි. ග්‍රෑ. | 725 | 714 | 692 |
| 4. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 13.1 | 17.9 | 16.7 |
| 5. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 3,918 | 2,084(ඇ) | 1,374(ඇ) |
| 6. මිළ | | | | |
| 6.1 අපනයන (නැ.වි.ස) | කි.ග්‍රෑ./රුපියල් | 37.65 | 44.34 | 51.81 |
| 6.2 කොළඹ ආර්.ඇස්.ඇස්. නො. 1 | කි.ග්‍රෑ./රුපියල් | 29.28 | 35.48 | 50.48 |
| 7. නිෂ්පාදන වියදම (ඈ) | කි.ග්‍රෑ./රුපියල් | 20.50 | 23.00 | 24.90 |
| 8. අපනයන | කි.ග්‍රෑ. දශලක්‍ෂ | 78.6 | 69.6 | 69.1 |
| 9. දේශීය පරිභෝජනය | කි.ග්‍රෑ. දශලක්‍ෂ | 28.8 | 32.9 | 34.0 |
| 10. අපනයන ඉපැයීම් | රු. දශලක්‍ෂ (විගැහි දශලක්‍ෂ) | 2,959.9 (48) | 3,086.3 (46) | 3,582.2 (51) |
| 11. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.0 | 1.0 | 0.9 |

මූලයන් : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ; ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) කුඩා වතුහිමියන්ගේ පමණි.
(ඈ) පෞද්ගලික අංශයේ සහ කුඩා ඉඩම් හිමියන්ගේ වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.
(ඉ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, කුඩා වතු හිමියන්ද ඇතුළු පුද්ගලික අංශයේ රබර් නිෂ්පාදන පිරිවැය පසුගිය වර්ෂය හා සසඳන කළ සියයට 8 ක වැඩිවීමක් පෙන්වමින් 1994 දී කිලෝග්‍රෑමයකට රුපියල් 24.90 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.

1985 වර්ෂයේ පටන් ක්‍රමවත් ලෙස වර්ධනය වූ දේශීය රබර් පරිභෝජනය 1994 දී කිලෝග්‍රෑම් දශලක්ෂ 34 ක් දක්වා සියයට 3 කින් තවදුරටත් වර්ධනය විය. මෙය එම වසරෙහි මුළු නිෂ්පාදිතයෙන් සියයට 32 ක් ලෙස ගණන් බලා ඇත. මෙසේ දේශීය රබර් පරිභෝජන මට්ටම වැඩිවීම කෙරෙහි රබර් ආශ්‍රිත කර්මාන්තවල ඇති වූ සැලකිය යුතු වර්ධනය හේතු විය.

කුඩා රබර් වතු හිමියන් සඳහා වඩාත් කාර්යක්‍ෂම සේවයක් සැලසීමේ අරමුණ ඇතිව, රබර් පාලන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයෙහි උපදේශක සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කොට 1994 වසරේ ජූනි මස 01 වැනි දින රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය.

පොල්

1994 වර්ෂයේ පොල් නිෂ්පාදනය, පසුගිය වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 21 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් පොල් ගෙඩි දශලක්ෂ 2,610 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය 1986 සිට වාර්තා වී ඇති වැඩිම නිෂ්පාදන මට්ටම වේ. 1993 වර්ෂයේ දී පැවති යහපත් කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම පොල් නිෂ්පාදනය වැඩිවීමට හේතු විය.

පොල් ගෙඩි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය සියයට 41 කින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 380 ක් වූ අතර, එය 1986 සිට වාර්තා වූ වැඩිම ප්‍රමාණය විය. 1990 වර්ෂයේ සිට අඩුවන ප්‍රවනතාවයක් පෙන්නුම් කළ පොල් තෙල් නිෂ්පාදනයේ ගෙඩි සමානය 1994 වර්ෂයේ දී තුන් ගුණයකට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 480 ක් ලෙස පැවතිණ. කොප්පරා අපනයනයේ ගෙඩි සමානය හා ගෙඩි පොල් අපනයනය පිළිවෙලින් සියයට 29 කින් හා සියයට 18 කින් වර්ධනය වී 1994 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 31 ක් හා ගෙඩි දශලක්ෂ 26 ක් විය. දේශීය පොල් ගෙඩි පරිභෝජනය සියයට 1 කින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 1,687 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1994 වර්ෂයේ මුළු පොල් නිෂ්පාදනයෙන් සියයට 65 ක් ලෙස ගණන් බලා ඇත.

නව වගා හැරුන විට විවිධ සහනාධාර ක්‍රම යටතේ සිදු කරන ලද සියළු වගා කටයුතු අඛණ්ඩව සිව්වන වර්ෂයටත් පසුබෑමකට ලක්විය. 1994 වර්ෂයේ දී අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 45 කින් වර්ධනය වී හෙක්ටයාර 657 ක් විය. මීට වෙනස්ව යමින් පුනරුත්ථාපනය කල බිම් ප්‍රමාණය සහ නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 53 කින් හා සියයට 46 කින් අඩුවී හෙක්ටයාර 1,062 ක් හා හෙක්ටයාර 842 ක් විය.

1993 වර්ෂයේ අවසාන භාගයේ දී පනවන ලද නීතිරීති වලට අනුව පොල් ඉඩම් වල ඇති වයස්ගත ගස් පළමු අදියරේ දී ඉවත් නොකිරීම නැවත වගා සහනාධාරය ලැබීමට නුසුදුසුකමක් විය. මෙසේ වයස්ගත ගස් ඉවත් කිරීමට වගාකරුවන් දැක්වූ අකමැත්ත නිසා නැවත වගා සහනාධාරය ලැබීමට සුදුසුකම් ලැබූ බිම් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබුණි.

වර්ෂය තුළදී අතුරුබෝග වගා කරන ලද පොල් ඉඩම් ප්‍රමාණය පස් ගුණයක වැඩිවීමක් පෙන්නුම් කරමින් හෙක්ටයාර 854 ක් විය. මෙම අති විශාල වර්ධනයට හේතු වී ඇත්තේ අතුරු බෝග වගා සහනාධාරය ලැබීමට බෝග වර්ග රාශියක් සුදුසුකම් ලැබීමයි.

1994 වර්ෂයේ පොල් වගා අංශය භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 14 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 30,200 ක් විය. කෙසේ වෙතත්, පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොහොර ගබඩා වලට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය වර්ෂය තුළදී සියයට 22 කින් වර්ධනය වී මෙට්‍රික් ටොන් 2,085 ක් විය. පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය පැල තවාන් ප්‍රමාණය 29 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. මෙම තවාන් මගින් නිකුත් කරනු ලැබූ පොල් පැල ප්‍රමාණය 1993 වර්ෂයේ දී සියයට 7 කින් වර්ධනය වූ අතර එය 1994 වර්ෂයේ දී තවදුරටත් සියයට 37 කින් වර්ධනය වී පොල් පැල දශලක්ෂ 2.36 ක් විය.

## 1.11 සංඛ්‍යා සටහන
## පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1992 - 1994

| ශීර්ෂය | ඒකකය | 1992 | 1993 (අ) | 1994(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ඇ) | ගෙඩි දශලක්ෂ | 2,296 | 2,164 | 2,610 |
| 1.1 කපාපු පොල් | ගෙඩි දශලක්ෂ(ඈ) | 365 | 269 | 380 |
| 1.2 පොල් තෙල් | ගෙඩි දශලක්ෂ(ඈ) | 242 | 176 | 480 |
| 1.3 කොප්පරා (ඉ) | ගෙඩි දශලක්ෂ)ඈ) | 29 | 24 | 31 |
| 1.4 පොල් ගෙඩි අපනයනය | ගෙඩි දශලක්ෂ | 25 | 22 | 26 |
| 1.5 දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි දශලක්ෂ | 1,635 | 1,668 | 1,687 |
| 2. සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.)(උ) | ගෙඩිය/රුපියල් | 6.47 | 6.31 | 5.67 |
| 3. පොහොර භාවිතය | මෙ.ටො. දහස් | 34.3 | 35.1 | 30.2 |
| 4. නිෂ්පාදන වියදම | ගෙඩිය/රුපියල් | 1.97 | 2.03 | 2.09 |
| 5. නැවත වගාව/යටි වගාව (ඌ) | හෙක්ටයාර | 1,589 | 1,553 | 842 |
| 6. නව වගාව (ඌ) | හෙක්ටයාර | 637 | 452 | 657 |
| 7. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 3,691 | 2,796 | 3,761 |
| | (විගැහි දශලක්ෂ) | (60) | (41) | (53) |
| 7.1 මඳ ආශ්‍රිත නිෂ්පාදන (උ) | රුපියල් දශලක්ෂ | 2,665 | 1,847 | 2,476 |
| | (විගැහි දශලක්ෂ) | (43) | (27) | (35) |
| 7.2 අනෙකුත් නිෂ්පාදන | රුපියල් දශලක්ෂ | 1,026 | 949 | 1,285 |
| | (විගැහි දශලක්ෂ) | (17) | (14) | (18) |
| 8. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්(එ) | | 3.1 | 2.6 | 2.4 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසදේ).
(ඈ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදාගත් අනුපාතිකයන්:
කපාපු පොල් මෙ. ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ.ටො. 1 = ගෙඩි 8,000 සහ
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925
(ඉ) අපනයන පමණි.
(ඊ) ඒකපුද්ගල වාර්ෂික ගෘහ පරිභෝජනය පොල් ගෙඩි 94.8ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.
(උ) ප්‍රධාන පොල් මඳ නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඌ) විස්තරාත්මක තොරතුරු ලබාගත නොහැකි බැවින් හෙක්ටයාර 0.4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.
(එ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : පොල් වගා කිරීමේ මණ්ඩලය;
පොල් සංවර්ධන අධිකාරිය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ
ශ්‍රී ලංකා මහ බැංකුව.

1994 වර්ෂයේ පොල් නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස කොළඹ වෙළෙඳපොළේ පොල් ගෙඩියක සාමාන්‍ය තොග මිළ සියයට 22 කින් පහත වැටී ගෙඩියක් රුපියල් 3.67 ක් විය. ප්‍රධාන පොල් මඳ නිෂ්පාදන වර්ග තුනෙහි සාමාන්‍ය අපනයන මිළ (නැ. වි. ස.), 1993 වර්ෂයේ දී සියයට 2 කින් අඩු වූ අතර, 1994 වර්ෂයේ දී එය තවදුරටත් සියයට 10 කින් පහත වැටී ගෙඩියකට රුපියල් 5.67 ක් විය. කෙසේ වෙතත්, පොල් මඳ නිෂ්පාදන අපනයනයෙන් ලද ආදායම 1993 වර්ෂයේ වි.ගැ.හි. දශලක්ෂ 27 හි සිට සියයට 30 කින් වර්ධනය වී වි.ගැ.හි. දශලක්ෂ 35 ක් විය. 1994 වර්ෂයේ අනෙකුත් පොල් නිෂ්පාදන අපනයනයෙන් ලද ආදායම සියයට 29 කින් වර්ධනය වී වි.ගැ.හි. දශලක්ෂ 18 ක් විය. මේ අතර, 1993 වර්ෂයේ සියයට 3 කින් වැඩි වූ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1994 වර්ෂයේ තවදුරටත් සියයට 3 කින් වැඩි වී ගෙඩියකට රුපියල් 2.09 ක් විය.

කපාපු පොල් මෝල් සංවර්ධන වැඩපිළිවෙල යටතේ වර්ෂය තුළදී තවත් රුපියල් දශලක්ෂ 3 ක් මෝල් හිමියන් 8 දෙනෙකු අතර බෙදා දෙන ලදී. 1993 වර්ෂයේ පොල් වගා කිරීමේ මණ්ඩලය හා එක්ව කෘෂි රක්ෂණ මණ්ඩලය ආරම්භ කරන ලද රක්ෂණ ක්‍රමය යටතේ, 1994 වර්ෂය තුළදී තවත් අළුතින් පොල් වගා කරන ලද හෙක්ටයාර 480 ක් රක්ෂණය කරන ලදී.

## වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන

### සුළු අපනයන බෝග

ආර්ථික වටිනාකමක් ඇති කුළු බඩු හා පානීය බෝග ඇතුළු බෝග සමූහයකින් සුළු අපනයන බෝග සමන්විත වේ. මෙම බෝග ප්‍රධාන වශයෙන් ගෙවතු වල සහ කුඩා වතුවල මිශ්‍ර බෝග ලෙස වගා කෙරේ. මෙය හේතුකොටගෙන මෙම වගාවන් යටතේ ඇති බිම් ප්‍රමාණය හෝ නිෂ්පාදනය පිළිබඳ නිවැරදි දත්තයන් ලබාගැනීම අපහසු වේ. කෙසේ වුවද, මෙම බෝග නිෂ්පාදිතයෙන් වැඩි ප්‍රමාණයක් අපනයනය කරන බැවින් අපනයන ප්‍රමාණයන් නිෂ්පාදන ප්‍රමාණයන්ට ආදේශකයක් ලෙස සලකනු ලැබේ. දේශීය පරිභෝජනය සහ තොග වෙනස්වීම් සැළකිය යුතු තරම් නොවේය යන උපකල්පනය මත සුළු අපනයන බෝගයන්හි නිෂ්පාදන ඇස්තමේන්තු සකස් කරණ බැවින් එය බොහෝදුරට දළ ඇස්තමේන්තු වේ.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව කෝපි සහ කරදමුංගු හැර අනෙකුත් සුළු අපනයන බෝග බොහොමයක නිෂ්පාදනය ඉකුත් වසර හා සසඳන කළ නොවෙනස්ව පැවතුණි. පසුගිය වසරෙහි සියයට 39 ක පහත වැටීමක් වාර්තා කළ කෝපි නිෂ්පාදනය 1994 වසරේදී මෙට්‍රික් ටොන් 3,687 ක් දක්වා සියයට 83 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. හිතකර කාලගුණික තත්ත්වය සහ පොහොර භාවිතය වැඩිවීම 1994 දී කෝපි නිෂ්පාදනය ඉහළ යෑම කෙරෙහි බලපෑවේය. 1993 දී සියයට 30 කින් පහත වැටුණු කරදමුංගු නිෂ්පාදනය 1994 දී මෙට්‍රික් ටොන් 40 දක්වා සියයට 33 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, මීටර් 1,062 ට වඩා උස් වනාන්තර බිම්හි ආර්ථික වගා කටයුතු වලට පනවා ඇති සම්බාධක හේතුවෙන් 1990 වර්ෂයෙන් පසුව කරදමුංගු නිෂ්පාදනය පහත වැටෙන උපනතියක් පෙන්නුම් කරණු ලැබීය. කරදමුංගු වගා ප්‍රදේශ වලින් සියයට 60 ක් පමණ මෙම සම්බාධක ප්‍රදේශයන්හි පිහිටා ඇත. කුරුඳු පොතු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 9,696 දක්වා සියයට 2 ක වර්ධනයක් වාර්තා කළ අතර, කොකෝවා නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් 1,463 දක්වා සුළු වශයෙන් වැඩි විය. කරාබු නැටි සහ සාදික්කා නිෂ්පාදනය 1993 වර්ෂයේ පැවැති මට්ටමෙහිම නොවෙනස්ව පැවතුණි. 1993 වර්ෂයේ දී ඉහළම වාර්තාගත නිෂ්පාදනයක් පෙන්නුම් කළ ගම්මිරිස් 1994 දී මෙට්‍රික් ටොන් 4,694 දක්වා සුළු අඩුවීමක් වාර්තා කළේය. ඉකුත් වාරයේ දී ලත් සාර්ථක එලදාවෙන් පසු එල දැරීමට ඇති හැකියාව අඩුවීම මෙම එලදාව පහත වැටීමට හේතු විය.

ගෙවී ගිය වසර දෙක තුළ පහත වැටුණු සුළු අපනයන බෝග අංශය භාවිතා කල පොහොර ප්‍රමාණය 1994 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 5,500 දක්වා සියයට 21 කින් තවදුරටත් පහත වැටුණි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පොහොර ආදර්ශන ක්‍රමය යටතේ නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 424 දක්වා සියයට 66 කින් පහත වැටුණි. 1994 වර්ෂයේ දී මෙම වැඩපිළිවෙලට සහභාගි වූ ගොවීන්ගේ සංඛ්‍යාව සියයට 43 කින් අඩුවීම මෙම පහත වැටීමට බොහෝදුරට හේතු විය.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුකූලව 1994 වර්ෂයේ දී ප්‍රධාන සුළු අපනයන බෝග යටතේ වූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 68,315 දක්වා සියයට 1 කින් වැඩි විය. මෙම වැඩිවීමට සම්පූර්ණයෙන්ම පාහේ දායක වූයේ ගම්මිරිස් හා කොකෝවා වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩිවීමයි. ඉකුත් වසරෙහි දී සියයට 5 කින් වැඩි වූ ගම්මිරිස් වගාව යටතේ වූ බිම් ප්‍රමාණය 1994 දී හෙක්ටයාර 11,517 දක්වා සියයට 4 කින් තවදුරටත් වැඩි විය. මේ අතර, කොකෝවා වගාව යටතේ වූ බිම් ප්‍රමාණය වසර තුළදී හෙක්ටයාර 8,039 දක්වා සියයට 3 කින් වැඩි විය.

පසුගිය වසර හා සසඳන කළ නැවත වගා කිරීමේ සහ අළුතින් වගා කිරීමේ කටයුතු වල ඉහළ ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබුණි. නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය වසර තුළ හෙක්ටයාර 138 දක්වා සියයට 34 කින් වැඩි වූ අතර, අළුතින් වගාකරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 793 දක්වා සියයට 23 කින් වැඩි විය. කෙසේ වුවද, 1993 දී සියයට 63 කින් පහත වැටුණු කුරුඳු සහ කොකෝවා යටතේ පුනරුත්ථාපනය කරන ලද බිම් ප්‍රමාණය 1994 වර්ෂයේ දී හෙක්ටයාර 118 දක්වා සියයට 65 කින් තවදුරටත් පහත වැටුණි.

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරය ඇතිව මැදරට බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1989 වර්ෂයේ දී පිහිටුවන ලද ණය සහනාධාර ක්‍රමය, මහනුවර, මාතලේ, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි නොකඩවා පස්වන වසර තුළදී ද ක්‍රියාත්මක වෙමින් පැවතිණ. වසර තුළ අළුතින් දිස්ත්‍රික්ක තුනක් මෙම ක්‍රමයට සහභාගි විය. එනම්, පුත්තලම, ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්ය. ප්‍රධාන සුළු අපනයන බෝග වැඩි ප්‍රමාණයක් ඇතුළත් බහු වාර්ෂික බෝගයන්හි නිෂ්පාදන ශක්‍යතාවය හා වාණිජමය නිෂ්පාදනයන් වැඩි කිරීම මෙම යෝජනා ක්‍රමයෙහි අරමුණ වේ. වසර තුළ මෙම ක්‍රමය යටතේ ලබාදුන් මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 144 කි. 1993 වර්ෂයේ දී මෙය රුපියල් දශලක්ෂ 41 ක් විය. මෙම ක්‍රමය යටතේ 1994 වර්ෂයේ ප්‍රතිලාභ ලත් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1,842 කි. ඉකුත් වර්ෂයේ දී මෙය හෙක්ටයාර 598 ක් විය. 1994 වර්ෂය අවසානය වනවිට මෙම ක්‍රමය යටතේ හෙක්ටයාර 4,078 ක ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 250 කි.

මෙතෙක් නොසලකා හැර තිබූ වැතිලා සහ පුවක් වගාව දිරි ගැන්වීම සඳහා 1994 දී නව යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. සුළු හා විශාල පරිමාණයෙන් සිදුකරන මෙම වැවිලි සඳහා රෝපණ ද්‍රව්‍ය හා තාක්ෂණික දැනුම මේ මගින් සපයනු ලැබේ.

## දේශීය කෘෂිකර්මය

### වී

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව ඇස්තමේන්තු කොට ඇති පරිදි 1994 වර්ෂයෙහි වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශලක්ෂ 2.68 ක් (බුසල් දශලක්ෂ 129) වූ අතර, මෙය පසුගිය වසරෙහි නිෂ්පාදනයට වඩා සියයට 4.4 ක වැඩි වීමකි. තවද, මෙය 1985 වර්ෂයෙහි වාර්තාගත වූ ඉහළ ම වී නිෂ්පාදනයට වඩා මෙට්‍රික් ටොන් විසිතුන් දහසක වැඩිවීමක් වන අතර මේ දක්වා වාර්තාගත වූ වැඩිම වී නිෂ්පාදනය ද වේ. යල කන්නයේ ලද විශාල අස්වැන්න වී නිෂ්පාදනය ඉහළ යාමට මුළුමනින්ම හේතු විය.

මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.67 ක් (බුසල් දශලක්ෂ 80) ලෙස ඇස්තමේන්තු කරන ලද 1993/94 මහ කන්නයෙහි වී නිෂ්පාදනය පසුගිය මහ කන්නයෙහි නිෂ්පාදනයට වඩා සියයට එකක අඩු වීමකි. වපුරන ලද සහ අස්වනු කපා ගන්නා ලද බිම් ප්‍රමාණය වැඩි වුවද සාමාන්‍ය ඵලදාව පහත වැටීම මෙම දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු විය. කුරුණෑගල දිස්ත්‍රික්කය නොකඩවා සත්වැනි වසරටත් මහ කන්නයේ ඉහළම අස්වැන්න වාර්තා කළේය. මෙට්‍රික් ටොන් 262,000 වූ මෙය මහ කන්නයෙහි මුළු වී නිෂ්පාදනයෙන් සියයට 16 ක් විය. කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි වී නිෂ්පාදනය මහ කන්නයෙහි මුළු නිෂ්පාදනයෙන් සතරෙන් පංගුවකට ( සියයට 27) වැඩි කොටසක් සඳහා දයක වී ඇත.

1993 වර්ෂයේදී සියයට 24 කින් ඉහළ ගිය යල කන්නයේ වී නිෂ්පාදනය 1994 වර්ෂයේදී තවදුරටත් සියයට 16 කින් වැඩි වී මෙට්‍රික් ටොන් දශලක්ෂය (බුසල් දශලක්ෂ 49) ඉක්මවී ය. ඵලදාවෙහි අඩු වීමක් දක්නට ලැබුණ ද, වපුරන ලද සහ අස්වනු කපා ගන්නා ලද බිම් ප්‍රමාණය වැඩිවීම හේතුකොටගෙන යල කන්නයෙහි වී නිෂ්පාදනය ඉහළ ගියේය. මුළු නිෂ්පාදනයෙන් පහෙන් කොටසක් පමණ වූ මෙට්‍රික් ටොන් 197,000 ක් නිපදවීමෙන් අම්පාර දිස්ත්‍රික්කය ඉහළම වී නිෂ්පාදනය වාර්තා කළේය. මුළු යල නිෂ්පාදිතයෙන් තුනෙන් කොටසකට (සියයට 36) වැඩි ප්‍රමාණයක් නිපදවීමට දයක වූයේ ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ වී වගා කරන අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකය.

1994 වර්ෂයේ හෙක්ටයාරයකින් ලැබුණු සාමාන්‍ය ඵලදාව ඉකුත් වර්ෂයට වඩා සියයට 4 කින් පහත වැටී කිලෝග්‍රෑම් 3,363 ක් විය. 1984 වර්ෂයෙන් පසු වාර්තාගත වූ අඩුම ඵලදාව මෙය වේ. කන්න දෙකෙහිම මෙම පසුබෑසීම දක්නට ලැබුණි. යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ජල සැපයුම වැඩිවීම නිසා වසර තුළ දී නිසරු බිම් වල ද වී වගා කරන ලදී. මෙසේ නිසරු බිම් වල වී වගාකිරීම සමස්ත සාමාන්‍ය ඵලදාව අඩුවීමට හේතුවිය. 1993/94 මහ කන්නයෙහි සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,345 දක්වා සියයකට 5 කින් පහත වැටුණි. පසුගිය යල කන්නයේදී සියයකට 7 කින් වැඩි වූ සාමාන්‍ය ඵලදාව 1994 යල කන්නයේදී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,393 දක්වා සියයට 2 කින් පහත වැටිණි. 1993/94 මහ කන්නයේදී උඩවලවේ ප්‍රදේශය නැවත වරක් වැඩිම සාමාන්‍ය ඵලදාව (හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,840) වාර්තා කළේය. මහවැලි "එච්" කලාපයෙන් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,830 ක සාමාන්‍ය ඵලදාවක් වාර්තා විය. නොකඩවා නව වැනි වසරටත් උඩවලවේ ප්‍රදේශය යල කන්නයෙහි වැඩිම සාමාන්‍ය ඵලදාව (හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,754) වාර්තා කළේය.

ඉකුත් මහ කන්නය හා සසඳන විට, 1993/94 මහ කන්නයෙහි සාමාන්‍ය ඵලදාව සියලු වාරිමාර්ග, එනම් ප්‍රධාන වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත යටතේ අඩුවීමක් පෙන්නුම් කරයි. ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශයන්හි සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,400 දක්වා සියයට 20 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණු අතර සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ප්‍රදේශයන්හි ඵලදාව පිළිවෙලින් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,080 සහ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,840 දක්වා සියයට 6 කින් සහ සියයට 2 කින් පහත වැටුණි. ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශයන්හි යල කන්නයේ සාමාන්‍ය අස්වැන්නද හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,871 දක්වා සියයට 8 කින් අඩු විය. මෙයට එරෙහිව යමින් සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ප්‍රදේශයන්හි 1994 යල කන්නයෙහි ඵලදාව පිළිවෙලින් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,932 ක් හා හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,454 ක් දක්වා සියයට 3 කින් සහ සියයට 4 කින් වැඩිවිය.

1993 වර්ෂයේ දී සියයට 4 කින් වැඩි වූ වී වපුරන ලද දළ බිම් ප්‍රමාණය 1994 වර්ෂයේදී හෙක්ටයාර 930,000 දක්වා සියයට 11 කින් තවදුරටත් වැඩිවිය. වපුරන ලද බිම් ප්‍රමාණය වැඩිවීමට කන්න දෙකම දායක විය. මහ කන්නයෙහි වපුරන ලද දළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 581,000 දක්වා සියයට 6 කින් වැඩි වූ අතර යල කන්නයෙහි මෙය හෙක්ටයාර 349,000 දක්වා සියයට 21 කින් සැලකිය යුතු ලෙස වැඩි විය.

1.12 සංඛ්‍යා සටහන

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1993 - 1994**

| ශීර්ෂය | ඒකකය | 1993 (අ) | | | 1994(ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 546 | 289 | 835 | 581 | 349 | 930 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශලක්ෂ | 418 | 185 | 603 | 633 | 211 | 844 |
| අස්වැන්න කපා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 538 | 282 | 820 | 561 | 336 | 897 |
| හෙක්ටයාරයක ඵලදාව (ඇ) | කිලෝග්‍රෑම් | 3,516 | 3,481 | 3,511 | 3,345 | 3,393 | 3,363 |
| අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 480 | 252 | 732 | 499 | 299 | 798 |
| නිෂ්පාදනය | මෙට්‍රික් ටොන් දහස් | 1,692 | 878 | 2,570 | 1,670 | 1,014 | 2,684 |
| | (බුසල් දහස්) | (81,124) | (42,089) | (123,213) | (80,054) | (48,616) | (128,670) |
| සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගැනීම් (ඇ) | මෙට්‍රික් ටොන් දහස් | 42 | 4 | 46 | 69 | 51 | 120 |
| සහල් ආනයන | මෙට්‍රික් ටොන් දහස් | - | - | 209 | - | - | 58 |
| (වී සමානය) | (මෙට්‍රික් ටොන් දහස්) | (-) | (-) | (299) | (-) | (-) | (85) |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොට ගත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු වී නිෂ්පාදනය අස්වනු නෙලා ගත් ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.
(ඇ) මහ කන්නයේ අස්වැන්න ජනවාරි-ජූලි කාලච්ඡේදය තුළ මිළදී ගත් අතර යල කන්නයේ අස්වැන්න අගෝස්තු-දෙසැම්බර් කාලච්ඡේදය තුළ මිළ දී ගන්නා ලදී.

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව; කෘෂිකර්ම දෙපාර්තමේන්තුව; කෘෂිකර්ම ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය; වී අලෙවි මණ්ඩලය; ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

1993 වර්ෂයේදී සියයට 7 කින් ඉහළ ගිය අස්වැන්න නෙලා ගත් මුළු දළ බිම් ප්‍රමාණය 1994 වර්ෂයේදී හෙක්ටයාර 897,000 දක්වා සියයට 9 කින් තවදුරටත් වැඩි විය. යල කන්නයේදී වපුරන ලද දළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 336,000 දක්වා සියයට 19 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර මහ කන්නයේදී මෙය හෙක්ටයාර 561,000 දක්වා සියයට 4 කින් වැඩි විය.

ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දත්තයන්ට අනුව වී වගා අංශය භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය 1994 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 267,400 දක්වා සියයට 8 කින් වැඩි විය.

වී අලෙවි මණ්ඩලය මගින් 1994 වර්ෂයේදී මිළදී ගන්නා ලද වී ප්‍රමාණය ඉකුත් වසරට වඩා දෙගුණයකටත් වඩා වැඩි වීමක් පෙන්නුම් කළ අතර මෙය මුළු වී නිෂ්පාදනයෙන් සියයට 4 කි. වී බුසලක් සඳහා වූ සහතික මිළ රුපියල් 155 ක් වශයෙන් වසර පුරා නොවෙනස්ව පැවතුණි.

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ වී වගා අංශයට දෙන ලද ණය ප්‍රමාණය 1994 දී රුපියල් දශලක්ෂ 844 දක්වා සියයට 40 කින් වැඩි විය.

අපතේ යෑම් සහ බීජ අවශ්‍යතා සඳහා වූ වෙන් කිරීමෙන් අනතුරුව වී නිෂ්පාදනයෙහි සහල් සමානය මෙට්‍රික් ටොන් 1,606,000 කි. මෙය ඇස්තමේන්තු ගත වාර්ෂික පරිභෝජනය හා සසඳන කල ස්වයංපෝෂිත අනුපාතයෙන් සියයට 87 කි. පසුගිය වසරේ ස්වයංපෝෂිත අනුපාතය සියයට 84 ක් විය.

ඉහළ ගිය වී නිෂ්පාදනය අනුව යමින් 1993 දී මෙට්‍රික් ටොන් 209,000 ක් වූ ආනයනික සහල් ප්‍රමාණය 1994 දී මෙට්‍රික් ටොන් 58,000 දක්වා පහත වැටුණි.

**සීනි**

1994 වර්ෂයේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 72,275 ක් විය. මෙය මෙතෙක් වාර්තා ගත ඉහළම නිෂ්පාදනය වන අතර, 1993 වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 5 ක වැඩිවීමකි. ඉකුත් වසරෙහි දී මෙන් හිඟුරාණ, පැල්වත්ත සහ සෙවනගල යන කම්හල් තුනම සීනි නිෂ්පාදනය වැඩි කිරීමට දායක විය. මෙට්‍රික් ටොන් 14,058 ක් වූ හිඟුරාණ කම්හලෙහි නිෂ්පාදනය සියයට 9 ක වැඩිවීමකි. 1993 වර්ෂයේ දී සියයට 17 කින් ඉහළ ගිය සෙවනගල කම්හලෙහි සීනි නිෂ්පාදනය 1994 දී ද, එම ප්‍රතිශතයෙන්ම ඉහළ යමින් මෙට්‍රික් ටොන් 18,535 දක්වා වර්ධනයක් වාර්තා කළේය. පැල්වත්ත කම්හලෙහි නිෂ්පාදනය 1994 දී මෙට්‍රික් ටොන් 39,682 දක්වා සුළු වශයෙන් වැඩි විය. විමසුමට ලක් වන කාලය තුළදී කන්තලේ සීනි කම්හලෙහි නිෂ්පාදනයක් වාර්තා වී නොමැත.

ඇඹරීමට යොදා ගත් උක් දඬු ප්‍රමාණය වැඩිවීම මෙන්ම සීනි ලබාගැනීමේ අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම හිඟුරාණ කම්හලෙහි නිෂ්පාදනය වැඩිකිරීමට දායක විය. සීනි ලබාගැනීමේ අනුපාතිකය අඩු වුව ද ඇඹරීමට යොදගත් උක් දඬු ප්‍රමාණය වැඩිවීම හේතුකොට ගෙන පැල්වත්ත සහ සෙවනගල කම්හල් හි නිෂ්පාදනය ඉහළ ගියේය. කම්හල් තුනෙහිම ඇඹරීමට යොදගත් උක් දඬු ප්‍රමාණය 1994 දී මෙට්‍රික් ටොන් 877,992 දක්වා සියයට 8 කින් වැඩි විය. හිඟුරාණ, සෙවනගල සහ පැල්වත්ත යන කම්හල්හි අඹරන ලද උක් දඬු ප්‍රමාණය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 188,822, මෙට්‍රික් ටොන් 211,853 සහ මෙට්‍රික් ටොන් 477,317 දක්වා සියයට 7 කින්, සියයට 21 කින් සහ සියයට 16 කින් වැඩි විය.

කම්හල් තුනෙහිම සමස්ත සීනි ලබාගැනීමේ අනුපාතිකය 1993 දී සියයට 8.47 හි සිට 1994 දී සියයට 8.23 දක්වා අඩු විය. කෙසේ වුවද, නොකඩවා දෙවන වසරට ද හිඟුරාණ කම්හලෙහි සීනි ලබාගැනීම් අනුපාතිකය වැඩි වූ අතර පැල්වත්ත සහ සෙවනගල කම්හල් හි සීනි ලබාගැනීමේ අනුපාතිකයන් අඩු විය. මෙම අඩුවීම මධ්‍යයේ වුවද සෙවනගල කම්හලෙහි නොකඩවා පස්වැනි වසරටත් ඉහළම සීනි ලබාගැනීමේ අනුපාතිකය (සියයට 8.74) වාර්තා කළේය.

1.13 සංඛ්‍යා සටහන

## සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා 1993 - 1994

| ශීර්ෂය | ඒකකය | හිඟුරාණ සීනි කම්හල | | කන්තලේ සීනි කම්හල | | සෙවනගල සීනි කම්හල | | පැල්වත්ත සීනි කම්හල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1993(අ) | 1994(ආ) | 1993(අ) | 1994(ආ) | 1993(අ) | 1994(ආ) | 1993(අ) | 1994(ආ) | 1993(අ) | 1994(ආ) |
| 1. උක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය (නිරි වගාව ඇතුළුව) (ඇ) | හෙක්ටයාර | 2,720 | 3,019 | 862 | - | 3,259 | 3,460 | 6,049 | 6,056 | 12,890 | 12,535 |
| 2. උක් දඬු කපා ගත් බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර | 2,263 | 2,505 | 450 | - | 2,378 | 2,331 | 6,004 | 4,009 | 11,095 | 8,845 |
| 3. කපාගත් උක් දඬු ප්‍රමාණය (ඇ) | මෙට්‍රික් ටොන් | 139,758 | 140,217 | 7,689 | - | 174,268 | 210,105 | 296,207 | 243,482 | 617,922 | 593,804 |
| 4. පෞද්ගලික අංශයෙන් මිලට ගත් උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 35,806 | 48.605 | - | - | 866 | 1,748 | 155,140 | 233,835 | 191,812 | 284,188 |
| 5. අඹරන ලද උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 175,564 | 188,822 | 7,689 | - | 175,134 | 211,853 | 451,347 | 477,317 | 809,733 | 877,992 |
| 6. සාමාන්‍ය ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 61.75 | 55.97 | 17.09 | - | 72.91 | 90.10 | 49.33 | 60.73 | 55.69 | 67.13 |
| 7. නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය (ආහාර කොමසාරිස්ගෙන් ලබාගත් අපතේ යන සීනි වලින් කළ නිෂ්පාදන හැර) | මෙට්‍රික් ටොන් | 12,880 | 14,058 | 366 | - | 15,895 | 18,535 | 39,462 | 39,682 | 68,603 | 72,275 |
| 8. සීනි ලබාගැනීමේ ප්‍රතිශතය (ඈ) | % | 7.35 | 7.45 | 4.90 | - | 9.20 | 8.74 | 8.74 | 8.31 | 8.47 | 8.23 |

මූලයන් : සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය;
සීමාසහිත හිඟුරාණ සීනි කර්මාන්තායතනය;
සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය සහ
සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනය.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන් ද ඇතුළත් වේ.

$$\text{(ඈ)} \quad \text{සීනි ලබාගැනීමේ ප්‍රතිශතය} = \frac{\text{නිෂ්පාදනය කල සීනි ප්‍රමාණය}}{\text{අඹරනලද උක්දඬු ප්‍රමාණය}} \times 100$$

කන්තලේ සීනි කම්හල හැර අනෙක් කම්හල් තුනෙහි තිරි වගාව ද ඇතුළුව, වසර තුළ උක් වගාවට යොදන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 12,535 ක් විය. හිඟුරාණ සහ සෙවනගල කම්හල්වල උක් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 3,019 සහ හෙක්ටයාර 3,460 දක්වා සියයට 11 කින් සහ සියයට 6 කින් වැඩි විය. පැල්වත්ත කම්හලෙහි මේ යටතේ ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර 6,056 දක්වා සුළු වශයෙන් හෙක්ටයාර 7 කින් වැඩිවිය.

හිඟුරාණ කම්හලෙහි උක් දඬු කපා ගත් බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,505 දක්වා සියයට 11 කින් ඉහළ ගියේය. සෙවනගල හා පැල්වත්ත කම්හල් හි උක් දඬු කපාගත් බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 33 කින් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උක් දඬු කපාගත් බිම් ප්‍රමාණය ඉකුත් වසර හා සසඳන කළ හෙක්ටයාර 8,845 දක්වා සියයට 20 කින් අඩු විය.

කර්මාන්ත ශාලා ආශ්‍රිත මධ්‍යගත වතු තුනෙහි වගා කළ බිම් ප්‍රමාණයෙහි පහත වැටීම අනුව යමින් කපාගත් උක් දඬු ප්‍රමාණය 1994 දී මෙට්‍රික් ටොන් 593,804 දක්වා පහත වැටුණි. 1993 වර්ෂයේ දී කපාගත් උක් දඬු ප්‍රමාණය හා සසඳන කළ මෙය සියයට 4 ක අඩු වීමකි. හිඟුරාණ කම්හලෙහි කපාගත් උක් දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 139,758 හි සිට මෙට්‍රික් ටොන් 140,217 දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර, සෙවනගල කම්හලෙහි වගාකල බිම් ප්‍රමාණය අඩු වුවත් කපාගත් උක්දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 210,105 දක්වා සියයට 21 කින් වැඩි විය. පැල්වත්ත කම්හලෙහි කපා ගත් උක්දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 243,482 දක්වා සියයට 18 කින් පහත වැටුණි.

හිඟුරාණ කම්හල යටතේ ඇති උක් වගාවේ සාමාන්‍ය ඵලදාව සියයට 9 කින් අඩු විය. කෙසේ වුවද, පැල්වත්ත සහ සෙවනගල කම්හල් යටතේ ඇති වගාවන් හි සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් සියයට 23 කින් සහ සියයට 24 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කම්හල් තුනෙහිම වගාවන් හි සමස්ත සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 67.13 දක්වා සියයට 21 කින් වැඩි විය.

පෞද්ගලික වගාකරුවන් විසින් සපයන ලද උක් දඬු ප්‍රමාණය 1994 දී මෙට්‍රික් ටොන් 284,188 දක්වා සියයට 48 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. සෙවනගල කම්හල මගින් මිළදී ගත් උක්දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,748 දක්වා දෙගුණයකින් වැඩිවූ අතර, හිඟුරාණ සහ පැල්වත්ත කම්හල් මගින් මිළදී ගත් උක්දඬු ප්‍රමාණය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 48,605 සහ මෙට්‍රික් ටොන් 233,835 දක්වා සියයට 36 කින් සහ සියයට 51 කින් වැඩි විය.

## අතුරු ආහාර බෝග

අර්තාපල්, මිරිස්, ලොකු ළූණු සහ රතුළූණු හැරුන විට අනෙකුත් අතුරු ආහාර බෝග වැඩි වශයෙන් වවනු ලබන්නේ හේන්වල සහ ගෙවතු වල මිශ්‍ර වගාවක් වශයෙනි. එමනිසා මෙම බෝග වගා කරන ස්වභාවය අනුව ඒවායේ නිෂ්පාදනය හෝ වගා කර ඇති බිම් ප්‍රමාණය පිළිබඳ දත්තයන් ක්‍රමාණුකූල ආකාරයට ලබා ගැනීම අපහසුය. මේ නිසා අතුරු ආහාර බෝගවල ක්‍රියාකාරීත්වය පිළිබඳ නිවැරදි විශ්ලේෂණයක් කිරීම අසීරු කරුණක්ව ඇත.

කෘෂිකර්ම ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශයේ තාවකාලික දත්තයන්ට අනුව, අතුරු ආහාර බෝගවල ක්‍රියාකාරීත්වය 1994 වර්ෂයේ දී මිශ්‍ර ප්‍රතිඵල පෙන්විය. ලොකු ළූණු නිෂ්පාදනය දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි වී මෙට්‍රික් ටොන් 81,000 ක් විය. මේ අතර, සෝයාබෝංචි, රටකජු සහ කුරක්කන් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 46 කින්, සියයට 33 කින් සහ සියයට 9 කින් වැඩිවිය. ලොකු ළූණු, සෝයා බෝංචි සහ රටකජු යන බෝගයන්හි අස්වැන්න වැඩිවීමට හේතු වූයේ වගා කරන ලද බිම් ප්‍රමාණයෙහි සැළකිය යුතු වර්ධනයක් ඇතිවීමයි.

### 1.14 සංඛ්‍යා සටහන
## අතුරු ආහාර බෝග සඳහා පදනම් මිල යෝජනා ක්‍රමය 1992-1994
### (කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල්)

| බෝගය | 1992 | 1993 | 1994 |
|---|---|---|---|
| බඩ ඉරිඟු | 5.25 | 6.00 | 6.00 |
| කුරක්කන් | 5.00 | 5.00 | 5.00 |
| රට කජු (පොතු සහිත) | 8.15 | 8.15 | 8.15 |
| සෝයා බෝංචි | 7.30 | 14.00 | 14.00 |
| තල | | | |
| කලු | 8.00 | 8.00 | 8.00 |
| සුදු | 9.90 | 9.90 | 9.90 |
| කව්පි | 9.00 | 9.00 | 9.00 |
| මුං ඇට | 12.00 | 20.00 | 20.00 |
| උඳු | 7.50 | 7.50 | 7.50 |

මූලය : කෘෂිකර්ම ඉඩම් සහ වනසම්පත් අමාත්‍යාංශය.

මේ අතර,1994 දී අනෙක් අතුරු ආහාර බෝගයන් වන මිරිස්, අර්තාපල්, රතු ළූණු, මුංඇට, උඳු, කව්පි, තල සහ බඩ ඉරිඟු නිෂ්පාදනයන්වල අඩු වීමක් වාර්තා කර ඇත. බඩ ඉරිඟු සහ අර්තාපල් වගා කරන බිම් ප්‍රමාණයෙහි වැඩිවීමක් තිබුණ ද සාමාන්‍ය ඵලදාව අඩුවීම හේතුවෙන් නිෂ්පාදනය අඩු වී ඇත. මේ අතර, මිරිස්, රතුළූණු, මුං ඇට සහ තල නිෂ්පාදනය අඩුවීමට හේතු වී ඇත්තේ වගා කරන ලද බිම් ප්‍රමාණයෙහි අඩුවීමයි. කව්පි වගා කරන ලද බිම් ප්‍රමාණයේ අඩුවීම සහ අඩු ඵලදාව හේතුවෙන් නිෂ්පාදනය පහත වැටුණි.

1994 වර්ෂයේ දී ද අතුරු ආහාර බෝග සඳහා වූ පදනම් මිළ යෝජනා ක්‍රමය වී අලෙවි මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලදී. එම පදනම් මිළ ගණන් පසුගිය වර්ෂයේ පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතිණි.

අතුරු ආහාර බෝග අංශය සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය 1993 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 44,300 ක් වුවද, 1994 දී එය සියයට 25 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 35,300 ක් විය.

### ධීවර සහ පශු නිෂ්පාදනය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තාවකාලිකව ගණන් බලා ඇති පරිදි 1994 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා සියයට 1 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 224,000 ක් විය. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන අංශයේ පහත බැසීමක් තිබියදීත්, මෙම වර්ධනය ලබා ගෙන ඇත්තේ හුදෙක් මුහුදු ධීවර අංශයේ වර්ධනය හේතුවෙනි.

මුළු මත්ස්‍ය නිෂ්පාදනයට සියයට 78 කින් දායක වූ වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය 1993 වර්ෂයේ මෙට්‍රික් ටොන් 169,900 සිට සියයට 3 ක වැඩිවීමක් පෙන්වමින් 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 174,500 ක් විය. ගැඹුරු මුහුද හා දියඹ අනු අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 14 කින් වර්ධනය වී මෙට්‍රික් ටොන් 37,500 ක් විය. මෙයට වෙනස්ව යමින්, මිරිදිය ධීවර අනු අංශය සියයට 33 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 12,000 ක් විය. 1990 දී රාජ්‍ය අනුග්‍රහය නවතා දැමීමෙන් පසු මිරිදිය මත්ස්‍ය අංශයේ නිෂ්පාදනය ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කරන අතර, 1989 වර්ෂයේ දී මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 19 ක් ලෙස වාර්තා වූ නිෂ්පාදනය සමඟ සසඳන කළ 1994 වර්ෂයේ එය සියයට 5 ක් විය.

පසුගිය වර්ෂ වලදී මෙන්ම පෞද්ගලික අංශය දිගින් දිගටම මත්ස්‍ය නිෂ්පාදන අංශයේ ප්‍රමුඛස්ථානය ගත් අතර, එය මුළු නිෂ්පාදනයෙන් සියයට 99 ක් ලෙස ගණන් බලා ඇත. ලංකා ධීවර සංස්ථාවේ මුළු මත්ස්‍ය සැපයුම පසුගිය වර්ෂයට වඩා සියයට 14 ක වැඩිවීමක් පෙන්නුම්

කරමින් මෙට්‍රික් ටොන් 2,222ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 1993 වර්ෂයේ සියයට 10 ක අඩුවීමක් පෙන්නුම් කළ ලංකා ධීවර සංස්ථාවේ අයිස් නිෂ්පාදනය තවදුරටත් සියයට 18 කින් පහත වැටී 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 3,698 ක් විය.

1.15 සංඛ්‍යා සටහන

**මත්ස්‍ය නිෂ්පාදනය 1990 - 1994**

මෙට්‍රික් ටොන්

| අනු අංශය | 1990 | 1991 | 1992 | 1993 | 1994(අ) |
|---|---|---|---|---|---|
| මුහුදු බඩ | 134,132 | 159,151 | 163,168 | 169.900 | 174,500 |
| ගැඹුරු මුහුද හා දියඹ | 11,666 | 15,080 | 22,000 | 33,000 | 37,500 |
| මිරිදිය | 31,265 | 23,832 | 21,000 | 18,000 | 12,000 |
| එකතුව | 177,063 | 198,063 | 206,168 | 220,900 | 224,000 |

(අා) තාවකාලික.

මූලය : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

මුහුදු ධීවර අංශයට දෙනු ලබන සහනාධාර ප්‍රමාණය පසුගිය වර්ෂයේදී මෙන් රුපියල් දශලක්ෂ 75 ක් විය. 1994 වර්ෂයේ දී, විවිධ සහනාධාර ක්‍රම යටතේ බෝට්ටු 109 ක් , සම්ප්‍රදායික යාත්‍රා 145 ක් සහ බහු දින බෝට්ටු 40 ක් මුහුදු ධීවර අංශය සඳහා නිකුත් කරන ලදී. පසුගිය වර්ෂය සමඟ සසඳා බලන කළ මුළු ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව හා මුළු සාමාජික සංඛ්‍යාව පිළිවෙලින් 769 හා 86,966 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. මේ අතර, වර්ෂය තුළදී සියළුම මාළු වර්ග වල සාමාන්‍ය සිල්ලර මිළ සියයට 20 කින් වැඩි විය.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු වලට අනුව, බිත්තර නිෂ්පාදනය 1993 වර්ෂයේ දශලක්ෂ 857 සිට 1994 වර්ෂයේ දශලක්ෂ 858 දක්වා සුළු වශයෙන් වැඩි විය. මේ අතර, කිරි නිෂ්පාදනය (මී දෙනුන්ගේ කිරි ද ඇතුළුව) පසුගිය වර්ෂය සමඟ සසඳන කල සියයට 2 කින් වැඩි වූ අතර එය ලීටර දශලක්ෂ 333 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 1993 වර්ෂයට වඩා සියයට 3 ක අඩුවීමක් පෙන්නුම් කරමින් 1994 වර්ෂයේ සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගම (මිල්කෝ) මගින් එකතු කළ කිරි ප්‍රමාණය ලීටර දශලක්ෂ 44 ක් විය. මේ අතර, නෙස්ලේ ලංකා සමාගම එකතු කරන ලද කිරි ප්‍රමාණය ද සියයට 9 කින් පහළ වැටී ලීටර දශලක්ෂ 34 ක් විය. වැඩිවන නිෂ්පාදන පිරිවැයට සරිලන පරිදි නිෂ්පාදකයාට කිරි ලීටරයක් සඳහා ගෙවන මිළ 1994 ජනවාරි 01 දින සිට රුපියල් 9.25 සිට රුපියල් 10.00 දක්වා ඉහළ නංවන ලදී. 1994 අප්‍රේල් 01 දින සිට කිරි නිෂ්පාදකයෙකුට ගෙවනු ලබන මිළ නැවත වතාවක් ලීටරයකට ශත 54 කින් වැඩිකර ලීටරයක් සඳහා රුපියල් 10.54 ක් ගෙවනු ලැබීය.

**පොහොර**

පසුගිය අවුරුදු 5 තුළ අත්හිටුවා තිබූ පොහොර සහනාධාර ක්‍රමය 1994 වර්ෂයේ ඔක්තෝබර් මස 10 දින සිට බලපවත්වන පරිදි රජය විසින් නැවත හඳුන්වාදෙන ලදී.

ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් සපයන ලද තාවකාලික දත්තයන්ට අනුව, 1993 වර්ෂයේ සියයට 15 ක වැඩිවීමට වෙනස්ව යමින් 1994 වර්ෂයේ භාවිතා කරන ලද මුළු පොහොර ප්‍රමාණය සියයට 2 ක අඩුවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 539,900 ක් විය. මුළු පොහොර භාවිතයෙන් සියයට 50 ක් වන විශාලතම කොටසට දායක වූ වී වගා අංශය භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 8 කින් වැඩි විය. ඊට එරෙහිව යමින් ,තේ, රබර්, පොල් සහ සුළු අපනයන බෝග අංශයන් සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය පිළිවෙලින් සියයට 11 කින්, සියයට 7 කින්, සියයට 14 කින් සහ සියයට 21 කින් අඩු විය. පොහොර සහනාධාරය නැවත හඳුන්වා දෙනු ඇතැයි පැවති අපේක්ෂාව නිසා, පොහොර භාවිතය සහ බෙදාහැරීම වර්ෂය තුළදී ව්‍යාකුල තත්ත්වයකට පත්විය.

## 1.16 සංඛ්‍යා සටහන
## බෝග අනුව පොහොර භාවිතය 1991 - 1994

මෙට්‍රික් ටොන් දහස්

| බෝගය | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
|---|---|---|---|---|
| 1. වී | 179.3 | 207.8 | 248.0 | 267.4 |
| 2. තේ | 118.9 | 110.2 | 147.2 | 131.0 |
| 3. රබර් | 13.7 | 13.1 | 17.9 | 16.7 |
| 4. පොල් | 28.8 | 34.3 | 35.1 | 30.2 |
| 5. අතුරු ආහාර බෝග | 50.7 | 49.5 | 44.3 | 35.3 |
| 6. සුළු අපනයන බෝග | 11.1 | 7.1 | 7.0 | 5.5 |
| 7. අනෙකුත් | 51.2 | 53.8 | 48.6 | 53.7 |
| එකතුව | 453.7 | 475.8 | 548.1 | 539.9 |

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

ප්‍රධාන පොහොර ආනයනකරුවා වශයෙන් රඳවාගෙන තිබූ ස්ථානය තවදුරටත් රැක ගනිමින් 1994 වර්ෂයේ දී ද, සීමා සහිත ලංකා පොහොර සමාගම මුළු පොහොර ආනයනයෙන් සියයට 30 කට (මෙට්‍රික් ටොන් 159,123) දයක වී ඇත. 1994 වර්ෂයේ දී අනෙකුත් පොහොර ආනයනකරුවන් විසින් ගෙන්වන ලද පොහොර ප්‍රමාණය සියයට 1 ක අඩුවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 380,365 ක් විය. වර්ෂය ආරම්භයේ දී තොග වෙළෙඳුන් සතුව පැවති, මුළු පොහොර තොග ප්‍රමාණය මෙට්‍රික් ටොන් 94,032 ක් වුවද, 1994 වර්ෂය අවසානයේ දී එය මෙට්‍රික් ටොන් 93,620 දක්වා අඩු විය.

## 1.17 සංඛ්‍යා සටහන
## පොහොර තොග අලෙවිය 1993 - 1994

| ආයතනය | 1993(අ) | | 1994(ආ) | | 1993 සහ 1994 අතර ප්‍රමාණයෙහි වෙනස්වීම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටොන්) | ප්‍රතිශතය | ප්‍රමාණය (මෙ.ටොන්) | ප්‍රතිශතය | |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 163,056 | 30 | 159,123 | 30 | -2 |
| සීමාසහිත ජනතා පොහොර ව්‍යවසාය | 60,406 | 11 | 50,476 | 9 | -16 |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 47,232 | 9 | ලැ.නො. | - | - |
| ඒ. බවර් සහ සමාගම | 68,939 | 12 | 63,642 | 12 | -8 |
| වෙනත් | 208,487 | 38 | 266,659 | 49 | +28 |
| එකතුව | 548,120 | 100 | 539,900 | 100 | -2 |

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලැබූ සියලුම ප්‍රධාන පොහොර වර්ග වල ලෝක වෙළෙඳපල මිළ ගණන් ඉහළ නැඟුණි. මේ අතුරින් යූරියා මිළ ගණන් තියුණු ලෙස ඉහළ යාම කැපී පෙනුන අතර මෙයට හේතු වූයේ යූරියා පොහොර නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය මිළ ගණන් ඉහළ යාම සහ යූරියා නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල පවත්වාගෙන ගිය කම්හල් වසා දැමීමයි.